*සැ. යු. -* මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2024 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරිසභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,387 - 2024 මැයි මස 31 වැනි සිකුරාදා - 2024.05.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 518 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 520 |


*සැ. යු.-*

i. සිවිල් නඩුවිධාන සංග්‍රහය (සංශෝධන) 2024 මැයි මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ii. ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) සංශෝධන පනත් කෙටුම්පත 2024 මැයි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජූනි 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූනි 07 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

සංශෝධනයයි

**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත, වරිපනම් බදු ප්‍රතිශතය සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය නිවේදනය කිරීම සම්බන්ධයෙන් 2024.01.26 දින පළ කරන ලද අංක 2,369 *ගැසට් පත්‍රයේ* 01-454 නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත, වරිපනම් බදු ප්‍රතිශතය
නිවේදනය කිරීම

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටු කරන, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ලේකම් එන්. ජී. එම්. පුෂ්පකුමාරි වන මා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 උප වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත සියයට පහක (5%) වරිපනම් බද්දක් පනවා අය කිරීමට උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

එන්. ජී. එම්. පුෂ්පකුමාරි,
ලේකම් හා බලතල කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරී,
මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
ඇලයාපත්තුව.

**විෂයභාර අමාත්‍යවරයාගේ විධානය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උප වගන්තියෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම නුවරගම් පළාත බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත වාර්ෂික වටිනාකමින් සියයට පහක (5%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අයකිරීම සඳහා මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය කර්තව්‍ය ඉටු කරන මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ලේකම් එන්. ජී. එම්. පුෂ්පකුමාරි ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

උතුරු මැද පළාත,
අනුරාධපුර.

05-319

---

**තුම්පනේ ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන මංමාවත් / පාරවල් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ වූ පියවර අනුගමනය කිරීම සම්බන්ධයෙන් අවසර දී ඇති කාලයක් වශයෙන් 2024.01.01 දින සිට 2027.12.31 දක්වා කාලය සැලකීමට 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වන වගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් අවසර දී ඇති හෙයින් ද, ඒ අනුව මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන මංමාවත් / පාරවල් තුම්පනේ ප්‍රාදේශීය සභාව සතු මංමාවත් / පාරවල් වශයෙන් සැලකීම සඳහා 2023.12.18 දින පැවති කළමනාකරණ කමිටුවේ හා

2024.03.19 දින අංක 1364 දරන තීරණය යටතේ තීරණය වී ඇති හෙයින් ඊට විරෝධතා ඇත්තේ නම් ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධි විධාන අනුව කටයුතු කිරීම සඳහා මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2024 මාර්තු මස 31 වැනි දින,
ගලගෙදර,
ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරී වසම* | *මාර්ගය පටන් ගන්නා ස්ථානය* | *මාර්ගය අවසන් වන ස්ථානය* | *වම් පැත්ත* | *දකුණු පැත්ත* | *දිග* | *පළල* | *පිඹුරු අංකය* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | ගලගෙදර එගොඩ වත්ත මාර්ගය | 301 - ගලගෙදර බටහිර | ගලගෙදර රඹුක්කන මාර්ගයේ මධ්‍යම පළාත් ප්‍රාග්ධන සමූපකාර සමිතිය ඉදිරිපිටින් පටන් ගෙන | ආර්.එම්.සීතා මිය හිමිකම් කියන ඉඩමේ පටන් ගන්නා ස්ථානයෙන් | 1. දිලක්ෂි විජේසේකර<br>2. ඒ. එම්. ටී. එච්. මෙත්තානන්ද<br>3. නිශාන්ති පෙරේරා<br>4. කේ. ඩී. එස්. සෙනවිරත්න<br>5. කේ. ඩී. එස්. සෙනවිරත්න<br>6. අත්තනායක<br>7. ඩී. බී. වීජේකෝන්<br>8. එස්. එස්. එස්. රත්නායක<br>9. එච්. ජී. පාලිත<br>10. පෙරේරා<br>11. මහේෂ් බෝගහලන්ද<br>12. කසුන් ඒකනායක<br>13. කිංස්ලි රත්නායක<br>14. චාමලි කෞශල්‍යා<br>15. රත්නායක<br>16. සෙනවිරත්න<br>17. ඩග්ලස්<br>18. ජී. කේ. සෙල්ලහේවා<br>19. වසන්ත | 1. ඊ. එම්. අයි. බී. කීර්තිසිංහ<br>2. බී. ඩබ්. එම්. බංඩාර<br>3. ඒ. එම්.එස්. බී. අත්තනායක<br>4. අතුල නවරත්න<br>5. ඒ. ජී. විජේපාල<br>6. එච්. බී. වීරසේකර<br>7. මහේෂ් බෝගහලන්ද<br>8. කසුන් ඒකනායක<br>9. සරත් කරුණාරත්න<br>10. විමලා විජේවර්ධන<br>11. කේ. බී. අලහකෝන් | මීටර් 486.7 | මීටර් 3.0 සිට 4.5 පමණ | 2023 |

**හම්බන්තොට මහා නගර සභාව**

මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාව

හම්බන්තොට මහා නගර සභාව විසින් 2023.11.29 වැනි දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීමේ දී තීරණ අංක 2023/11/29/346 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. ජී. ජී. රන්දික,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහා නගර සභාව.

.
2023 නොවැම්බර් මස 29 වැනි දින,
හම්බන්තොට මහා නගර සභාවේ දී ය.

**යෝජනාව**

"1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂය භාර අමාත්‍ය වන ගුස්තිඤ්ඤු වඩු ශාන් විජයලාල් ද සිල්වා මැතිතුමන් විසින් කෙටුම්පත් කර 2013 මැයි මස 17 වැනි දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලද්ද වූ මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා සංග්‍රහය සමග කියවිය යුතු 2015 දෙසැම්බර් මස 04 වැනි දින අංක 1944 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* 12-159 දරන නිවේදනය මගින් පිළිගනු නොලැබූ xi සහ xxiv වන කොටස්වල ඇතුළත් අතුරු ව්‍යවස්ථා හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගනු ලැබිය යුතු බවත්, එසේම එසේ පිළිගත් සම්මත අතුරු ව්‍යවස්ථා හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක කළ යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නී ය.

05-280

---

# විවිධ දැන්වීම්

**නගර සභාව ත්‍රිකුණාමලය**

ත්‍රිකුණාමලය නගර සභා ලේකම්ගේ 2024.04.26 වැනි දිනැති අංක 2024/04/26/297 දරන රැස්වීම් තීරණය හා 2024.03.28 වැනි දිනැති අංක 2024/03/28/284 දරන රැස්වීම් තීරණයට අනුව පහත දැක්වෙන පරිදි 2024 වසරට අදාළව දෛනික ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම් හා ලීටර් 6000 ධාරිතාව සහිත බවුසරයකට ද්‍රව්‍යමය අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහාවන ගාස්තු පහත සඳහන් පරිදි අයකර ගැනීමට ත්‍රිකුණාමලය නගර සභාව විසින් තීරණය කර ඇත.

පරිසර ආරක්ෂණය, අතිරේඛ අපද්‍රව්‍ය ඉවත් කිරීම, පෞද්ගලික ආයතන/රාජ්‍ය ආයතන - 2024 සේවා ගාස්තු

සේවා ගාස්තු - ඉවත් කරනු ලබන ඝණ අපද්‍රව්‍යවල ප්‍රමාණය, ඉන්ධන හා අනෙකුත් වියදම්, කම්කරු කුලී යනාදියට අනුව රු. 4000 සිට රු. 12000 දක්වා වන මුදලක් අයකර ගැනීමට නගර සභාව තීරණය කරනු ලැබේ. මේ අනුව මීට පෙර 2024 ජනවාරි 01 වැනි දින *ගැසට්* පත්‍රයේ පළ කරන ලද මුදල වෙනස් කර ඇති අතර වෙනසට ලක් වූ ගාස්තුවලට අදාළව 2024 ජනවාරි සිට මුදල් ගෙවිය යුතුයි.

ත්‍රිකුණාමලය නගර සභා ලේකම්ගේ 2024.04.26 වැනි දිනැති අංක 2024/04/26/297 දරන රැස්වීම් තීරණයට අනුව පහත දැක්වෙන පරිදි 2024 වසරට අදාළව ලීටර් 6000 ධාරිතාව සහිත බවුසරයකට ද්‍රව අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා වන ගාස්තු පහත සඳහන් පරිදි අයකර ගැනීමට නගර සභාව විසින් තීරණය කර ඇත.

*නගර බල සීමාව තුළ :*

| | | |
|---|---|---|
| 1. පාසල් හා ආගමික ස්ථානවලට | රු. | 6750.00 |
| 2. නිවාස | රු. | 8250.00 |
| 3. රාජ්‍ය දෙපාර්තමේන්තු බැංකු සහ පෞද්ගලික ආයතන හා හොටෙල් | රු. | 15000.00 |
| 4. අප ජලය ඉවත් කිරීමේ ගාස්තු | රු. | 10500.00 |

*නගරයෙන් පිට :*

| | | |
|---|---|---|
| 1. පාසල් හා ආගමික ස්ථානවලට | රු. | 6750.00 |
| 2. නිවාස | රු. | 9000.00 |
| 3. රාජ්‍ය දෙපාර්තමේන්තු බැංකු සහ පෞද්ගලික ආයතන හා හොටෙල් | රු. | 18000.00 |
| 4. අප ජලය ඉවත් කිරීමේ ගාස්තු | රු. | 10500.00 |

4 කණුවෙන් පිට ස්ථාන සඳහා ඉහත ගාස්තු සමඟ අමතරව රු. 5000.00 (1Km) ඉන්ධන වියදම අයකරනු ලැබේ.

වී. රාජසේකර්,
ලේකම්,
නගර සභාව,
ත්‍රිකුණාමලය.

05-316

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.